# Living the LOTUS

Buddhism in Everyday Life

1 2019

VOL. 160


## Founder's Essay

## ශරීරයට බද්ධ වූ පුරුදු වල ශක්තිය

උදාහරණයක් ලෙස ජූඩෝ ක්‍රීඩා කරන ආකාරය වාගේම, බේස් බෝල් ක්‍රීඩාව හෝ ගොල්ෆ් ක්‍රීඩාවද 'මේ ආකාරයටයි සෙල්ලම් කරන්නේ' කියා ඉගෙන ගත්තද, සැනෙකින් ඒ ආකාරයටම කිරීමට නොහැකිවේ. දිනපතා පුරුදු පුහුණුවීම් වල නැවත නැවත යෙදීම තුලින් ක්‍රීඩා කරන ආකාරය ශරීරයට බද්ධ වී, තරග කිරීමට හැකිවන්නේය.

ආගමික ශ්‍රද්ධාවත් එලෙසමය. ධර්ම කරුණු එක් වරක් ඇසූ පමණින් අවබෝධ වුවත්, එම කරුණු නියමාකාරයෙන් ශරීරයට බද්ධ කර ගැනීමට නම්, දිනපතා ප්‍රායෝගික පුහුණුව අත්‍යාවශයය. නමුත් ධර්මය ඇසීම පමණක් ප්‍රමාණවත්, පුහුණුවක් අවශ්‍ය නැතැයි මිත්‍යාමත වල අය සිටියද, එසේ පුරුද්දක් ඇති කර ගැනීමෙන් ලැබෙන ශක්තිය අමතක නොකල යුතුය.

යහපත් පුරුදු මෙන්ම, නරක පුරුදු ශරීරයට බද්ධ වූ විට මනුෂ්‍යයන්ගේ අධිෂ්ඨානය, තීරණ ගැනීමේ ශක්තිය, මෙන්ම එම පුද්ගලයන්ගේ ජීවිතයටද බලපෑම් එල්ලවේ. යහපත් පුරුදු ශරීරයට බද්ධ වූ විට, හිතාමතාම උත්සහයක් නොගත්තත් ඉතා පහසුවෙන් කරුණු කාරණා කිරීමට හැකිවේ. අනෙක් අතට, නරක පුරුදු බද්ධ වී තිබුණ විට, තම අධිෂ්ඨානයට වඩා ප්‍රතිවිරුද්ධ දිශාවට හිමින් හිමින් ගමන් කරයි.

නිතිපතා හමුවෙන පුද්ගලයන්, නිතිපතා ඇතිවන සිදුවීම් ගැන දකින ආකාරය, සිතන ආකාරය හා ක්‍රියාකරන ආකාරය ධර්මානුකූල වන ලෙසට පුරුදු ඇතිකර ගැනීම වැදගත් වේ. එසේ පුහුණුවේ යෙදීමට ඇති හොදම ස්ථානය, ධර්ම ශාඛාව (ඩෝජෝව) හා සාමාජිකයන් වේ.

*Kaiso zuikan* 9 පි. 30-31


**Living the Lotus**
**Vol. 160 (January 2019)**

Senior Editor: Koichi Saito
Editor: Eriko Kanao
Copy Editor: P.A.D. Somapala, G.N. Ruklanthi, Sahan Chamara

*Living the Lotus* is published monthly
by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international@kosei-kai.or.jp


රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි. වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙද ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවූ ලස්සන නෙලුම් මලක් සේ තම ජීවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවූ සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවූ අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදාහැරීම සිදු කරනු ලැබේ.

## *President's Message*

# සියළුදෙනාම තුලම යහපත් මූලයක් තිබේ

නිච්කෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය



## වියළී ගිය මුල් වලට තෙතමනය ලබාදෙමු

සුභ නව වසරක් වේවා, මේ වසරේදීත් ප්‍රීතීමත් හදවතින් අපි සියළුදනාම එක්ව බුද්ධ මාර්ගයේ ගමන් කරමු.

මේ වසරේදීත් ඔබ සියළුදෙනාම, තම හදවත තුල නොයෙකුත් ප්‍රාර්ථනයන්ගෙන් යුතුව, පවිත්‍ර වු හැඟීමෙන්, ආධ්‍යාත්මික දියුණුව ඇතිකර ගැනීමට බලපොරොත්තු වනවා යැයි සිතමි.
නමුදු, නොයෙකුත් හේතුන් මත පවිත්‍ර වු හැඟීමට පත් නොවී, 'ශුභවාදී සිතුවිලි වලින් තොරවූ' අයද සිටියි.

ඒ ආකාරයට තරුණ අවධියේදීම අසනීප වී, තම ජිවිත කාලයම ලෙඩින් ගත කිරීමට සිදුවේ යැයි සදහන් කල කෙනෙකුගේ කතාවක් පවසන්නම්, අනාගතය ගැන අශුභවාදීව සිතා බලාපොරොත්තු අත් හැර ගෙන සිටි එම පුද්ගලයාට, එක් ජේෂ්ඨ සාමාජිකයෙක් නිතරම පවසා තිබුණේ.... 'ඔබ තුල යහපත් මුලයක් තිබෙනවා' යන්නයි.

ඒ ආකාරයට ප්‍රශංසා කරන විට, තමාගේ වටිනාකමක් නැත, යන සෘණාත්මක හැගීම් හා අශුභවාදී සිතුවිලි නැතිවී ගොස් 'මමත් අන්‍යයන් වෙනුවෙන් කුමක් හෝ කළ යුතුයි, මට කරන්න පුළුවන්' යන හැගීමට එම තරුණයා ටිකෙන් ටික පත්විය.

අපි සක්ඣායනා කරන සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල, විවිධාර්ථ සූත්‍රයේ, 1 වන පරිච්ඡේදය නිදන කථාවේ ''සියළු සත්වයන්ගේ යහපත් මූලයන් වර්ධනය කිරීම සදහා'' ලෙස වැකියක් ඇත. යහපත් මූලයන් යනු, යහපත් ප්‍රථිපල ලබාදෙන පදනම බවට පත්වන මුලයි. එය 'සෑම කෙනෙක් තුලම බුදුන් වහන්සේ හා සමාන ස්වභාවයකින් යුතු, බුදුන් වහන්සේගේ ස්වරූපය'' වන ''බුද්ධ ස්වභාවයයි''. නමුත්, එම මුල නිරෝගීව හදවඩා ගෙන වර්ධනය කිරීමට නම්, වියළී ගිය මුල් වලට ප්‍රාණවත් බව ලබාදීමට තෙතමනය අත්‍යාවශ්‍යය.

ජීවිතයේ බලාපොරොත්තු සුන්ව, තමාගේ වටිනාකමක් නැතැයි සිතා සිටි තරුණයාට, 'ඔබ තුල මිල කළ නොහැකි යහපත් මූලයක් තිබෙනවා' ලෙස පැවසීම, හරියට වියළිගිය මූලයට නොපසුබටව තෙතමනය ලබා දුන්නා හා සමානය.

දැන් එම තරුණයා තමා හා සමාන දුකට පීඩාවට පත්ව සිටින පුද්ගලයන්ගේ යහපත් මුලයන්ට තෙතමනය ලබා දෙමින්, බුදුන් වහන්සේගෙන් ලැබු ආශිර්වාදය බෙදහැරීමේ කටයුතු සිදු කරමින් සිටියි.

# නියම 'සම්මා දිට්ඨික පිරිසක්' බවට

විවිධාර්ථ සූත්‍රයේ පෙර සඳහන් කළ ''සියළු සත්වයන්ගේ යහපත් මූලයන් වර්ධනය කිරීම සඳහා'' යන වාක්‍යයට පසුව ''යහපත් බවේ බීජයන් වපුරා'' ලෙස සඳහන් වේ. 'අපි ලෝකය වෙනුවෙන්, පුද්ගලයන් වෙනුවෙන්, යහපත් බීජයන් විශාල ප්‍රමාණයක් වපුරමු' තවත් ආකාරයකින් පවසනවා නම්, 'ධර්මය කියාදී, තමනුත් අන්‍යයනුත් සතුටට පත්වෙමු' ලෙසයි ධර්ම ව්‍යාප්තියේ සඳහන් වන්නේ.

'යහපත් වීජයන් වපුරමු' යනු, විශාල පිරිසකගේ වියළී ගිය මුලට තෙතමනය ලබාදීම හා සමානය. නමුදු එය 'ධර්ම ව්‍යාප්තිය' ලෙස සඳහන් කරන්නේ මන්ද, එයට ඇත්තේ එකම හේතුවකි.

පෙර සඳහන් කළ තරුණයා හා සමානව, ධර්මය අසා හදවතේ මූලය තෙතමනය වී, මංමුලාවීමේ ආගාධයෙන් මිදුන පසුව 'අන්‍යයනුත්, තමා හා සමානව දුක් කම්කටොළු වලින් මිදී, තමා ඉදිරියේ තිබෙන සතුට අවබෝධ කරගත යුතුය' යන මෛත්‍රියේ හදවත ඇතිවන නිසාය.

කලින් සඳහන් කළ දුකට වේදනාවට පත් වු තරුණයාද මුල සිටම අවංකවම ධර්මය පිළිගෙන කටයුතු කලා නොවේ. ඒ අරුතෙන් පවසන කල 'ධර්ම ව්‍යාප්තියේ' ඉතා වැදගත් වන්නේ, මුලින්ම 'සමීපයේ සිටින්නාවු අය සමඟ යහපත් සබඳතාවයක් ඇති කර ගැනීමේ' ප්‍රාර්ථනයෙන් ජීවිතය ගත කිරීමය. අන්‍යයන් ගැන සිතන කරුණික වදන් භාවිතය හා ක්‍රියාකලාපය, දුකට වේදනාවට පත්වූ පුද්ගලයන්ගේ වියළීගිය හදවතේ මූලයට තෙතමනය ලබාදෙන බැවිනි.

ඒ අනුව අපි සූත්‍ර සක්ඣායනය, ධර්මය ඉගෙන ගැනීම ආදී තෙවදෑරුම් ශ්‍රද්ධා ක්‍රියාවලිය පුහුණුවේ යෙදමින්, පුද්ගලයන්ව ධර්මය වෙත ළඟා කළ යුතුය. එය 'සියළු සත්වයන් තුල අවබෝධය සඳහා අභිප්‍රාය ඇති කර වන' (සෑම සියළු සත්වයෙකු තුල බුදු බවට පත්වීමේ හදවත ඇති කරවන) විශිෂ්ඨ වු ජීවන ගමනකට සැබෑදෙන්නේය.

මේ ආකාරයට, සියළුදනාම ''බුදුන් වහන්සේ හා විය යුතුය' ලෙස අධිෂ්ඨාන කරගත් පිරිස, ''සම්මා දිට්ඨික පිරිසක්'' වේ. මාගේ විශ්ව විද්‍යාල ආචාරයවරයෙකුද පැවසුවේ 'ධර්ම ව්‍යාප්තිය නොමැතිව දහමක පැවැත්මක් නොමැතිය' ලෙසයි. එබැවින් අප සියළුමදෙනා සහනයක් ප්‍රාර්ථනා කරන සියළුදෙනාම වෙනුවෙන්, ඕනෑම වෙලාවක සිතට සහනයක් ලබාදිය හැකි 'සම්මා දිට්ඨික පිරිසක්' බවට පත්විය යුතුයි සිතමි.

From Kosei, January 2019.

# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය

## 4 වන පරිච්ඡේදය, විශ්වාසය හා අවබෝධය (1)

### 'විශ්වාසය' හා 'අවබෝධය'

මෙම පරිච්ඡේදයේ මාතෘකාවේ සඳහන් 'විශ්වාසය හා අවබෝධය'' යන්නෙහි, 'අවබෝධය' යනු, හොඳින් අවබෝධ කර ගැනීම වේ. න්‍යායන් තුළින් නිගමනයන්ට එළැඹ 'ඇත්තමයි නේ' ලෙස මනසින් තේරුම් ගැනීමය. 'විශ්වාසය' යනු, අවබෝධ කරගත් කරුණු හොඳින්ම හදවතට තැන්පත් කරගෙන 'මුළුමනින්ම එහෙමයි නේ' ලෙස පොඩි හෝ සැකයක්වත් නොමැති බවය.

සාමාන්‍ය විෂයන්, තාක්ෂණය, ඊට අමතරව එදිනෙද ජීවිතය පවත්වා ගැනීමට අවශ්‍ය දැනුම ආදිය මුලින්ම අවබෝධ කරගෙන, එය නිවැරදිව (න්‍යායන්ට අනුකූලව) ක්‍රියාත්මක කලාට කම්නැතැයි කල්පනා කලද, එයින් පමණකින් කරදරයක් බාධකයක් නොමැතිව මෙලොවෙහි දේවල් සිදු නොවේ. එයට 'විශ්වාසය' යන මූලික කරුණද අත්‍යාවශයය.

උදහරණයක් ලෙස, ගුණකිරීම් වලදී '8*9, 72' වේ ලෙස එකින් එක ගණන් හදන්නේ නැත. පාසල් යන කාලයේ ඉගෙන ගත් ගුණ කිරීමේ වගුව සත්‍යය යැයි විශ්වාස කරන නිසා, කිසිම සැකයක් නැතිව '7*9,63', '8*9,72' ලෙස මුමුණමින් ගණන් හදයි. එය සත්‍යය හා යථාර්තය වන බැවින් එයින් කම්නැත.

නමුදු, ආගමික කියාදීම් වලදී මෙම 'විශ්වාසය' අනිවාර්ය වූ සාධකයක් බවට පත්වේ. බුදු දහම නවීන විද්‍යාව සමඟ එකට බද්ධ වූ තාර්කික කරුණු වලින් යුතු කියාදීම් නිසා මුලින්ම අවබෝධ කර ගැනීම වැදගත්ය, නමුත් එයින් පමණක් ප්‍රමාණවත් නොවේ. අවබෝධය පුළුල්වීම තුලින් ඉමහත් වූ හැඟීමක් ඇතිවී, සතුටක් උපදීමෙන් 'නියම වූ දුකින් මිදීම' යථාර්තයක් කර ගැනීමට හැකිවන්නේ. එම හදවතේ හැඟීම විශ්වාසය ලෙසද, ශ්‍රද්ධාව ලෙසද හඳුන්වයි. බුදුදහම තාර්කාන්විත බුද්ධිමත් කියාදීම් ලෙස පැවසුවත්, ධර්ම කරුණු ශ්‍රද්ධාවෙන් විශ්වාස කරන්නේ නැති තෙක් බුදුදහමේ නියම වටිනාකම පිළිඹිබු නොවේ.

3 වන පරිච්ඡේදයේ 'උපමා කථාවක්' ට අනුව ශාරිපුත්‍ර තෙරුණ් වහන්සේට අමතරව සම්පූර්ණ වශයෙන් ධර්මය අවබෝධ කරගෙන විශ්වාසය ඇති කරගත් ශ්‍රාවකයන් බිහිවුනි. ඒ මහා සුභූති තෙරුණ්, මහා කත්‍යාන තෙරුණ්, මහා කාශ්‍යප තෙරුණ් හා මහා මුගලන් තෙරුණ් යන හතර නමය. එම තෙරුන් වහන්සේලා සම්පූර්ණ වශයෙන් ධර්මය අවබෝධ කරගෙන විශ්වාසය ඇතිකර ගත්තේ, 'උපාය කෞෂල්‍යය පරිච්ඡේදයේ' ඉගිකර දැක්වූ, 'මනුෂ්‍යයන් බුද්ධ ශක්තියෙන් යුතුය, සෑම කෙනෙක්ටම සත්‍යාවබෝධය ලබා ගැනීමට හැකිවේ.' යන්න හා 'බුදුන් වහන්සේ නොයෙකුත් උපමා මාර්ගයෙන් ධර්මය දේශනා කරනවා වුවද, එයින් පෙන්වා දෙන්නේ සෑම සියළු දෙනාම තමා තුල තිබෙන බුද්ධ ශක්තිය අවබෝධ කරගෙන, සත්‍යාවබෝධය ලබා ගැනීම හෙවත් බුදු බවට පත්වීමට හැකිය යන එකම එක කරුණය'.

එම හතර නම හදවතින් ධර්මාවබෝධය ලබා ගත්තා පමණක් නොව, 'මේ ආකාරයට ධර්මාවබෝධය ලබා ගත්තා' යනු බුදුන් වහන්සේ ඉදිරියේදී සවිස්තරව ප්‍රකාශ කරන ලදී. එය ඉතාම වැදගත්ය, තමා ආගමික අත්දැකීම් අන් අයට ප්‍රකාශ කිරීම තුලින් තම ආගමික විශ්වාසය වැඩිවී සම්පූර්ණත්වයට පත්වේ.

මෙම සතර නම නියෝජනය කරමින් මහා කාශ්‍යප තෙරුණ් වහන්සේ ඉදිරිපත් කළ තම අත්දැකීම් කථාව (සෙප්පෝව) උපමා කථා වලින් යුතු විය. එහි තිබූ 'දිළිඳු පුත්‍රයාගේ උපමාව' සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයට ඉමහත් වූ අලංකාරයක් ගෙන දෙයි. එම උපමා කථාව පහත සඳහන්ය.

එක් ධනවත් සිටු පවුලක ඉපදුන දරුවෙකු සිටියහ. එම දරුවා කුඩා කාලයේදීම නිවසෙන් පලාගොස්, දීර්ඝ කාලයක්



## දිළිඳු පුත්‍රයාගේ උපමාව

වෙනත් ගමක ජීවත්වුනි. එම පුතා මෙහෙකරුවෙක් ලෙස සේවය කරමින් කාලය ගත කලහ. කාලයත් සමගම පුතාගේ වයස අවුරුදු 50 ක් පමණ වන වි, ඉබාගාතේ තනියම ඇවිදිමින් තමාගේ ගමට පැමිණියහ.

පියා වන ධනවත් සිටුතුමා, දරුවා නොමැති වීමෙන් ඉතා දුකට පත්ව, සෑම තැනම සෙව්වත් සොයා ගැනීමට නොහැකි විය.

එක් දිනක් ඔහු, තම පියාගේ විශාල මාළිගය ඉදිරියේ සිටගෙන සිටියත්, එය තම පියාගේ නිවස බව නොදැන සිටියාය. සිටුතුමා මාළිගයේ සිට බලන විට පිටත සිටගෙන සිටින තම පුතාව දුටු සැනින්, අඳුරාගැනීමට සිටුතුමාට හැකිවිය.

එම මාළිගය ඉතා අලංකාරය. 'මෙවැනි තැනක සිටියොත්, මා හොරෙකු යැයි වැරදි අවබෝධයක් ඇති වන්නට පුළුවන්' ලෙස බිය වී පුතා එතැනින් පලා ගියහ.

පලා යන පුතා ගැන පුදුම වී, ඔහුව රැගෙන එන ලෙස නිවසේ මෙහෙකරුවන්ට දැන්විය. ඔහුව අල්ලාගත් විට, බය වී සිහිසුන් විය. නමුත්, එලෙස ඔහුව රැගෙන ඒම නවතා දැමීය. ඉන් පසු, මෙහෙකරුවන් දෙදෙනෙකු යොදවා, වැසිකිලි පිරිසිදු කිරීමේ රැකියාවක් තිබෙන බව පවසා ගෙන්වා ගත්හ. සිටු පියාද, මෙහෙකරුවෙකු ආකාරයට තම ස්වරූපය වෙනස් කර ගනිමින්, පුතා සමග කටයුතු කරමින්, ඔහුට සමීප වී 'ඔබ මගේම පුතෙකු යැයි සිතනවා' ලෙස පවසා, අළුත් නමක්ද දැම්මේය.

එතැන් සිට අවුරුදු 20 ක් පමණ පිරිසිදු කිරීමේ කටයුතු වල නිරත වු පුතා, ටිකෙන් ටික නිවසේ සැහැල්ලුවෙන් සිටියත්, තමා මෙහෙකරුවෙක් පමණකි යන හීනමානය



එසේම තිබුණි. ඉන් ටික කලකට පසු සිටු තුමා අසනීප තත්වයට පත් වීමෙන්, සියළුම සම්පත් වල වගකීම පුතාට භාර දුනී. පුතා රැකියාව කරමින් නිවසේ සියළුම සම්පත් පිළිබඳ අවබෝධය ලබා ගත් පසු, සිතේ භීතිය නැතිවී ගියහ. ඒ බව අවබෝධ කර ගත් සිටු පියා, මන්දිරයේ සියළුදෙනාම කැඳවා, ' සත්‍ය වශයෙන්ම මේ මාගේ පුතාය. මගේ සියළු සැප සම්පතක්ම මොහුගේය' ලෙස ප්‍රකාශ කලහ. එවිට පුතා, 'මේ ආකාරයේ සැප සම්පත් හිමිකර කර ගැනීම මගේ අරමුණක් නොවිය. මේ සියලු සම්පත් සියළුමදේ මගේ වීම පුදුමයකි' යැයි ඉතා සතුටට පත් විය.

මේ මස සිට නික්යෝ නිවානෝ තුමා විසින් රචිත
『සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාංශය හා වැදගත් කරුණු』

කෝසේයි මුද්‍රණ ආයතනයේ ප්‍රකාශනයකි. 2016, P57—P63)

# Director's Column

## නියම 'සම්මා දිට්ඨික පිරිස'ක් බවට

නව වසරත් උදාවිය. මම රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයේ අන්තර්ජාතික මූලස්ථානයේ ගත කරන 2 වෙනි වසරේ ආරම්භයයි මේ වසරේදීත් 'කෘතවේදීත්වය හා බෝධිසත්ව චර්යයාව' තේමාව කරගෙන ආධ්‍යාත්මික දියුණුව ඇති කර ගැනීමට බලාපොරොත්තු වෙමි.

ජනවාරි මස ධර්ම පණිවුඩයේදී නිච්කෝ නිවානෝ තුමා විසින්, නැවත වරක් 'ධර්ම ව්‍යාප්තියේ' වැදගත්කම පෙන්වාදී තිබේ. සියළුම මනුෂ්‍යයන් තම වටිනාකම අවබෝධ කර ගැනීමට නම්, අන් අය ගැන සිතන වදන් භාවිතය හා යහපත් ආකල්ප තුලින් බැඳීම් ඇතිකර ගැනීම වැදගත්ය. ඒ තුලින් වේදනාවට හා පීඩාවට පත් වූ පුද්ගලයන්ගේ හදවතට සහනයක් දීමට හැකි පිරිසක් බවට පත්වීමේ වැදගත්කම පෙන්වාදී තිබේ.

මේ වසරේ ඇමෙරිකාවට ධර්ම ව්‍යාප්තිය සිදුවී 60 වන සංවත්සරයත් සමගම, අන්තර්ජාතික ධර්ම ව්‍යාප්තිය සිදුවී 60 වන සංවත්සරයද සමරයි. නැවතත් ආරම්භක පදනම වෙත හැරී බලා 'සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයට අනුකූලව, සියළු ලෝක වැසියන් දුකින් මුදවා ගැනීම සඳහා' වන වගකීම ලෝකය පුරා සිටින සාමාජිකයන් සමඟ බෙදා ගනිමින් නියම වූ 'සම්මා දිට්ඨීක පිරිස'ක් බවට පත්වීම අරමුණු කරගෙන ධර්ම ව්‍යාප්ත කටයුතු කිරීමට පියනගමු.

මේ වසරේදීත් ඔබ සියළු දෙනාගේ සහයෝගය අපේක්ෂා කරමි.


රි.කෝ.කා. අන්තර්ජාතික මූලස්ථාන ප්‍රධානී
කෝයිචි සයිතෝ මහතා





We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai: A Global Buddhist Movememt




**Rissho Kosei-kai International**
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1124 *Fax:* 81-3-5341-1224
*e-mail:* living.the.lotus.rk-international@kosei-kai.or.jp

**Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First Street, Suite #1, Los Angeles, CA 90033, U.S.A
*Tel:* 1-323-262-4430 *Fax:* 1-323-262-4437
*e-mail:* info@rkina.org http://www.rkina.org

**Branch under RKINA**

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003 U.S.A.
*Tel:* 1-253-945-0024 *Fax:* 1-253-945-0261
*e-mail:* rkseattlewashington@gmail.com
http://buddhistlearningcenter.org/

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
6083 Babcock Road, San Antonio, TX 78240, U.S.A.
P.O. Box 692148, San Antonio, TX78269, U.S.A
*Tel:* 1-210-561-7991 *Fax:* 1-210-696-7745
*e-mail:* dharmasanantonio@gmail.com
http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Tampa Bay**
2470 Nursery Road, Clearwater, FL 33764, U.S.A.
*Tel:* (727) 560-2927 *e-mail:* rktampabay@yahoo.com
http://www.buddhismtampabay.org/

**Rissho Kosei-kai of Vancouver**

**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, U.S.A.
*Tel:* 1-808-455-3212 *Fax:* 1-808-455-4633
*e-mail:* info@rkhawaii.org http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1817 Nani Street, Wailuku, HI 96793, U.S.A.
*Tel:* 1-808-242-6175 *Fax:* 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740 U.S.A.
*Tel:* 1-808-325-0015 *Fax:* 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, U.S.A.
*Tel:* 1-323-269-4741 *Fax:* 1-323-269-4567
*e-mail:* rk-la@sbcglobal.net http://www.rkina.org/losangeles.html

**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
1031 Valencia Way, Pacifica, CA 94044, U.S.A.
*Tel:* 1-650-359-6951 *Fax:* 1-650-359-6437
*e-mail:* info@rksf.org http://www.rksf.org

**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016 U.S.A.
*Tel:* 1-212-867-5677 *Fax:* 1-212-697-6499
*e-mail:* rkny39@gmail.com http://rk-ny.org/

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056 U.S.A.
*Tel :* 1-773-842-5654 *e-mail:* murakami4838@aol.com
http://rkchi.org/

**Rissho Kosei-kai of Fort Myers**
http://www.rkftmyersbuddhism.org/

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
2745 N.W. 40th Street, Oklahoma City, OK 73112 U.S.A.
*Tel:* 1-405-943-5030 *Fax:* 1-405-943-5303
*e-mail:* rkokdc@gmail.com http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago Street, #809 Denver, CO 80204 U.S.A.
*Tel:* 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
425 Patterson Road, Dayton, OH 45419 U.S.A.
http://www.rkina-dayton.com/

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP,
CEP 04116-060 Brasil
*Tel:* 55-11-5549-4446 / 55-11-5573-8377 *Fax:* 55-11-5549-4304
*e-mail:* risho@terra.com.br http://www.rkk.org.br

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP,
CEP 08730-000 Brasil
*Tel:* 55-11-5549-4446 / 55-11-5573-8377

**Rissho Kosei-kai of Taipei**
4F, No. 10 Hengyang Road, Jhongjheng District,
Taipei City 100, Taiwan
*Tel:* 886-2-2381-1632 *Fax:* 886-2-2331-3433
http://kosei-kai.blogspot.com/

**Rissho Kosei-kai of Tainan**
No. 45, Chongming 23rd Street, East District,
Tainan City 701, Taiwan
*Tel:* 886-6-289-1478 *Fax:* 886-6-289-1488

**Korean Rissho Kosei-kai**
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420,
Republic of Korea
*Tel:* 82-2-796-5571 *Fax:* 82-2-796-1696
*e-mail:* krkk1125@hotmail.com

**Korean Rissho Kosei-kai of Busan**
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
*Tel:* 82-51-643-5571 *Fax:* 82-51-643-5572

**International Buddhist Congregation (IBC)**
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1230 *Fax:* 81-3-5341-1224
*e-mail:* ibcrk@kosei-kai.or.jp http://www.ibc-rk.org/

**Branches under the Headquarters**

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road,
North Point, Hong Kong, Republic of China

**Rissho Kosei-kai of Ulaanbaatar**
15F Express tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
*Tel:* 976-70006960 *e-mail:* rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Sakhalin**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk
693005, Russian Federation
*Tel & Fax:* 7-4242-77-05-14

**Rissho Kosei-kai Friends in Shanghai**

**Rissho Kosei-kai of South Asia Division**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel:* 66-2-716-8141 *Fax:* 66-2-716-8218

**Rissho Kosei-kai International of South Asia (RKISA)**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel:* 66-2-716-8141 *Fax:* 66-2-716-8218
*e-mail:* thairissho@csloxinfo.com

**Branches under the South Asia Division**

**Rissho Kosei-kai of Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar, Kolkata 700094,
West Bengal, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya**
Ambedkar Nagar, West Police Line Road
Rumpur, Gaya-823001, Bihar, India

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsilhel, Sancepa-1, Lalitpur, Kathmandu,
Nepal

**Rissho Kosei-kai of Phnom Penh**
#201E2, St 128, Sangkat Mittapheap, Khan 7 Makara,
Phnom Penh, Cambodia

**Rissho Kosei-kai of Patna**
**Rissho Kosei-kai of Singapore**

**Thai Rissho Friendship Foundation**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel:* 66-2-716-8141 *Fax:* 66-2-716-8218
*e-mail:* info.thairissho@gmail.com

**Rissho Kosei-kai of Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
*Tel & Fax:* 880-31-626575

**Rissho Kosei-kai of Dhaka**
House#408/8, Road#7(West), D.O.H.S Baridhara,
Dhaka Cant.-1206, Bangladesh
*Tel & Fax:* 880-2-8413855

**Rissho Kosei-kai of Mayani**
Mayani(Barua Para), Post Office: Abutorab, Police Station:
Mirshari, District: Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Patiya**
Patiya, sadar, Patiya, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Domdama**
Domdama, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Cox's Bazar**
Ume Burmese Market, Main Road Teck Para, Cox'sbazar,
Bangladesh

**Rissho Kosei-kai of Satbaria**
Satbaria, Hajirpara, Chandanish, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Laksham**
Dupchar (West Para), Bhora Jatgat pur, Laksham, Comilla,
Bangladesh

**Rissho Kosei-kai of Raozan**
West Raozan, Ramjan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Chendirpuni**
Chendirpuni, Adhunagor, Lohagara, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Ramu**

**Rissho Kosei Dhamma Foundation, Sri Lanka**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
*Tel:* 94-11-2982406 *Fax:* 94-11-2982405

**Rissho Kosei-kai of Habarana**
151, Damulla Road, Habarana, Sri Lanka

**Rissho Kosei-kai of Polonnaruwa**

**Branches under the Headquarters**
**Rissho Kosei-kai di Roma**
Via Torino, 29-00184 Roma, Italia
*Tel & Fax:* 39-06-48913949 *e-mail:* roma@rk-euro.org

**Rissho Kosei-kai of the UK**
**Rissho Kosei-kai of Venezia**
**Rissho Kosei-kai of Paris**